මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council
අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.
web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com
කාර්යාලය காரியாலயம் Office 081-2213097
ලේකම් செயலாளர் Secretary 081-2213096
වට්ස් ඇප් අංකය வட்ஸ்அப் இல. Whatsapp No 070-7213097
ෆැක්ස් பெக்ஸ் Fax 081-2213082

මගේ අංකය எனது இல. My No. CPC/PSC/01/35

ඔබේ අංකය உமது இல Your No.

දිනය திகதி Date 2026.10. 31

මධ්‍යම පළාත්
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ සභා ලේකම්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන්,

සියලුම නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම හා ප්‍රමාණනය සම්බන්ධවයි.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර සිදු කරනු ලබන පත්වීම්/ උසස්වීම් ලබාදීම් සම්බන්ධ සම්මුඛ පරීක්ෂණ වලදී නිලධාරීන්ගේ කාර්යසාධන වාර්තාවන්හි ඇගයුම් කිරීම හා ප්‍රමාණනය කිරීම නිසි පරිදි සිදු නොවී තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර, මෙය අදාල නිලධාරීන් හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයද අපහසුතාවයට පත්වන අවස්ථාවන්ට හා අදාල පත්වීම් ලබා දීමේදී ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදුවන අවස්ථා පිළිබඳව ගරු කොමිෂන් සභාවේ අවධානයට ලක්වී ඇත.

කාර්ය සාධන ඇගයීම් හා ප්‍රමාණනය සම්බන්ධ නිරීක්ෂණය වූ කරුණු

- ඇගයුම්කරු හා ප්‍රමාණනකරු නිසි පරිදි ඇගයුම/ ප්‍රමාණනය සිදු නොකර තිබූ අවස්ථා (උදා. ඉතාහොඳයි/හොඳයි/සතුටුදායකයි/දුර්වලයි යන ඇගයුමේදී හෝ ප්‍රමාණනයේදී අනවශ්‍ය වචන කපා නොහැරීම)
- ඇගයුම්කරු හා ප්‍රමාණනකරු නිසි පරිදි තම අත්සන් තබා නොතිබීම/ නිල මුද්‍රා තබා නොතිබීම.

02. කාර්යසාධන වාර්තාවන්හි ඇගයුම හා ප්‍රමාණනය නිසි පරිදි සිදු නොවී තිබීම අදාල නිලධාරීන්ගේ පාලනයෙන් බැහැර කරුණක් වන බැවින්ද, මෙසේ සිදුවීම නිලධාරීන්ට අගතියක් සිදුවීමට ඉඩ ප්‍රස්ථා ඇති බැවින්ද, මේ සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කර මෙම ගැටළුව මග හරවා ගැනීමට අවශ්‍ය කටයුතු සලස්වන ලෙස ගරු කොමිෂන් සභාවේ තීරණය මත කාරුණිකව දන්වා සිටිමි.

03. කාර්යසාධන වාර්තාවන්හි නිසි ඇගයුම් කිරීම හා ප්‍රමාණනය සිදුකිරීම අදාල ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් වන බැවින්, ඉදිරියේදී මේ පිළිබඳව තම පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටින අතර, මේ සම්බන්ධයෙන් ඔබ යටතේ අදාල සියලුම නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, මින් ඉදිරියට අඩුපාඩු සහිතව එවන කාර්ය සාධන වාර්තා පිළිබඳව මෙම කොමිෂන් සභාව වගකීමක් නොදරන බවද තවදුරටත් දන්වා සිටිමි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ඒ.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.